# බුදුදහම අතක්කාවචරද? යන්න පිළිබඳ බෞද්ධ ඥානමීමාංසාත්මක අධ්‍යයනයක්

කඩවලවැවේ කල්‍යාණ හිමි

The question addressed in this study is whether Buddhism is in fact; non-reasoning and non-argumentative. atakkāvacara means tendency, for non-reasoning and a non-argumentative style. (takkañāṇassa agōcarato atakkāvacaro) the argument is based on the premise that the findings/ results are dependent on the composition of these components. Since Lord Buddha preached Dhamma in a language that had been developed on argument, reason and logical structure, the Dhamma he preached itself must also be of 'reason and argument'. The Buddha even built his fundamental concepts on a foundation of argument, reason, knowledge and, intelligence. 'Correct decisions are a result of correct argument and reasoning'; being the concept, the Sandaka Suttha in the Majjima Nikaya states: 'decisions can correspond to the components of its argument'. In the Dheega Nikaya four types of investigators (tharkikayan) are cited. Amongst them, it is stated that the Suddhathakkika are those who reason and argue on a foundation of Reason being the cause of Result. In view of the foregoing, we can conclude that the Dhamma is not founded on non-reason and non-argument, instead, non-reason and non-argumentative is the Nirvana that cannot be described in the common language of man. Further, it is clear that Buddhism rejects an argument for the sake of spiteful argument and argument as the only means to knowledge.

## හැඳින්වීම

විශ්වව්‍යාපී පරම සත්‍යය පරමාර්ථ වශයෙන් තත්වාකාරයෙන් අවබෝධ කරගත් බුදුරජාණන් වහන්සේ ලෝක සත්ත්වයාහට එය මැනවින් දේශනා කොට වදාළහ.

උන් වහන්සේ එම ධර්මය දේශනා කළේ ශ්‍රැතියක් සේ ආදානග්‍රාහීත්වයෙන් ගැනීමට නොව විචාර පූර්වකව විමසා බලා අවබෝධ කරගැනීමටය. **(විචෙයසො දෙසිතො භික්ඛවෙ මයා ධම්මෝ)**[1] මෙහි විචාර පූර්වක බව යනු තාර්කික බවයි. එය ප්‍රඥා ගෝචර බුද්ධිමතුන්ට විශේෂයෙන් ගෝචර වූ ධර්මයක් බව බුද්ධ වචනය තුළින්ම ප්‍රකට වේ. **(පඤ්ඤාවන්තස්සායං ධම්මො)** එසේ වුවත් උන්වහන්සේ බුද්ධිවාදියෙකු ලෙස අන්තගාමීව තර්කය එකම ඥාන මාර්ගය කරගනිමින් යථාර්ථය අවබෝධ කරගැනීමට හෝ ධර්මය දේශනා කිරීමට හෝ යුහුසුළු නොවූහ. තමන් දේශනා කරන ධර්මයේ ස්වභාවය කෙබඳුදැයි පැහැදිලි කරමින් බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙන්නේ **ගම්භීරෝ සො ධම්මෝ දුද්දසෝ දුරනුබෝධෝ සන්තෝ පණීතෝ අතක්කාවචරෝ නිපුණෝ පණ්ඩිත වේදණීයෝ"**[2] ගැඹුරු දූරදර්ශී, අවබෝධයෙහි පහසු නොවූ, ශාන්ත, ප්‍රණීත, තර්කයෙහි ගෝචර නොවන පණ්ඩිත වේදනීය දෙයක් බවයි. මෙහි දී අතක්කාවචරෝ යන වචනය වැදගත් වේ. එයින් ගම්‍ය වන්නේ බුදුදහම අතක්කාවචර හෙවත් තර්කයට ගෝචර නොවන බවද? යන්න විමසා බැලිය යුතුය. එම වචනයෙහි අර්ථය පරීක්ෂා කරන අට්ටකථාචාරීන් වහන්සේලා පෙන්වා දෙන්නේ **අතක්කාවචරෝති තක්කේන අවිචරතබ්බෝ ඕගාහිතබ්බෝ න හොති ඤාණෙන ච අවිචරිතබ්බෝ.....**[3] අතක්කාවචර යනු තර්කයට ගෝචර නොවන තර්කයෙන් නොගත යුතු යන අර්ථයයි. තවත් අවස්ථාවක ද අතක්කාවචර යන්න මෙම අර්ථයෙන්ම තෝරා ඇති අයුරු ඉතිවුත්තක අට්ඨකථාවේ දැක්වේ.[4]

**"ධම්මො ගම්භීරො දුද්දසො දුරනුබෝධො සන්තො පණීතො අතක්කාවචරො නිපුණො පණ්ඩිත වේදනීයො"** යන බුද්ධ වචනය පාදක කර ගනිමින් බුදු දහම අතක්කාවචර දහමක් බව පෙන්වා දීමට බොහෝ දෙස් විදෙස් උගත්හු උත්සාහ දරති. බෙරිඩේල් කීත් මහතා, සමස්ත බුදුසමය තුළ තාර්කික සිද්ධාන්තවලට තැනක් නොලැබෙන අතර බුදුරජාණන් වහන්සේ තාර්කිකත්වය අගය නොකළ බව ප්‍රකාශ කරයි. නමුත් මෙම කරුණ මදක් ගැඹුරින් විමසා බැලිය යුතුය. බුදුදහම භාෂාව මගින් විග්‍රහ කිරීමේදීත් ඒ පිළිබඳ ප්‍රාථමික අවබෝධයේදීත් පුද්ගලාන්තර සන්නිවේදනයේදීත් තර්කන බුද්ධිය නිරායාසයෙන් උපයුක්ත කරගෙන ඇති බව පෙනේ. එයට හේතුව භාෂාව හා තර්කය අවියෝජනීයව සම්බන්ධ වී තිබීමයි. වචනය මාධ්‍ය කරගනිමින් යමක් ඉදිරිපත් කිරීමේ දී එහි තර්කානුකූල භාවයක් තිබිය යුතුය. එසේ නොමැති වුවහොත් කරනු ලබන ප්‍රකාශයේ වාස්තවික (Objectivity) බව ක්ෂීණ වී යයි. බුදු දහම තුළ ද භින්න රුචික සමාජයට භාෂාත්මක තර්කයේ සීමාවන් හා ප්‍රඥප්තීන් හඳුනාගත් අයට ධර්මය දේශනා කිරීමේ අවකාශ සැලසෙන අයුරු දී.නි. පොට්ඨපාද සූත්‍රයේ දැක්වේ.

මෙහි දී විශේෂ වශයෙන් අවධාරණය කළ යුත්තක් නම් බුදු රජාණන් වහන්සේ ධර්ම දේශනා කිරීමේ දී තාර්කික න්‍යායන් මත පදනම්ව දාර්ශනිකව දහම් දෙසීමක් සිදු නොකළ බවයි. උන්වහන්සේ මෙලොව පරලොව යන උභයාර්ථ සංසිද්ධිය පිණිස ඒ ඒ අවස්ථාවට උචිත වන පරිදි පුද්ගලානුරූපිව ස්වකීය දේශනයන් සිදු කළහ. එහි දී කරුණු තාර්කිකව ගැළපෙනවා ද? නැද්ද? යන්න පිළිබඳව අවධානය යොමු නොකළහ. නමුත් බුද්ධ දේශනාවන් කෙරෙහි සාවධානය යොමු කරන විට පෙනී

යන කරුණක් නම් උන්වහන්සේ ඓහලෞකික වශයෙන් දේශිත සෑම කරුණක්ම තාර්කිකව ගැළපෙන බවත් ඒවායෙහි වාස්තවිකත්වය අකාලික බවත්ය. මෙනිසා බුද්ධ දේශනාවන් අතාර්කික හෝ තර්කයට විෂය නොවන බව ප්‍රකාශ කිරීමේ යුක්තියුක්ත බව මීට වඩා විමසා බැලිය යුතුය.

## පර්යේෂණ ගැටලුව

ඇතැම් වියතුන් අදහස් කරන පරිදි බුදුරජාණන් වහන්සේගේ දේශනා අතක්කාවචර හෙවත් තර්කයට ගෝචර නොවේ. ධම්මො ගම්භීරො දුද්දසො දුරනුබෝධො සන්තෝ පණීතො **අතක්කාවචරො** නිපුණො පණ්ඩිතවේදනීයො යන සූත්‍ර දේශනා පාඨය බොහෝ අවස්ථාවන්හි තත් කාරණය සාධනය කිරීම සඳහා උපයෝගී කරගන්නා ආකාරය දැකගත හැකිය. ඒ අනුව මෙම අධ්‍යයනයේ අධ්‍යයන ගැටලුව වන්නේ බුදු දහම තර්කයට ගෝචර නොවන තර්කය ප්‍රතික්ෂේප කළ දහමක්ද? යන්න පිළිබඳ විමසීමයි.

## අධ්‍යයන අරමුණු

මෙම අධ්‍යයනයෙහි පර්යේෂණ අරමුණු කිහිපයක් සාධනය කිරීමට අපේක්‍ෂා කෙරේ. ඒ අතර ලෝක භාෂා මාධ්‍යයෙන් දේශනා කොට ඇති බුදුදහම අතක්කාවචර නොවන බවත්, අතක්කාවචර වන්නේ භාෂාව නම් වූ ලෞකික මෙවලමෙන් අවබෝධ කළ විශ්වීය යථාර්ථය (නිවන) පමණක් බවත් පෙන්වා දීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණයි. ඊට අමතරව බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කිරීමේ දී විවිධ තාර්කික ක්‍රම අනුගමන කරමින් විනේය ජනයන් තුළ ධර්මාවබෝධය ඇති කර ඇති ආකාරය ත්‍රිපිටකයේ අන්තර්ගත සූත්‍ර සහ අභිධර්ම පිටකාගත තොරතුරු ආශ්‍රයෙන් මෙහි දී විමසනු ලැබේ. එමෙන්ම බුද්ධ ධර්මය තාර්කික පදනමක් මත ගොඩනැගී ඇති අයුරු පෙන්වා දීම ද මෙම පර්යේෂණයේ අරමුණකි. තර්කය අධානග්‍රාහීත්වයෙන් හා දෘෂ්ටිග්‍රාහීත්වයෙන් තොරව ඥානවිභාගය සඳහා භාවිත කළ හැකි බව බෞද්ධ ඉගැන්වීම් ආශ්‍රයෙන් පෙන්වා දීමට මෙම අධ්‍යයනයේ දී අපේක්ෂා කෙරේ.

## අධ්‍යයන ක්‍රමවේදය

මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණයක් වශයෙන් සිදු කරන අතර ත්‍රිපිටකයේ මූල ග්‍රන්ථ පාදක කරගනිමින් දත්ත සම්පාදනය කර ඇත. එමෙන්ම ඇතැම් කරුණු පැහැදිලි කිරීම සඳහා අටුවාවන්හි පැනෙන නිරුක්තීන් ද උපයෝගී කර ගෙන ඇත. මුල් බුදුසමය ඒ ඒ ආශ්‍රිත කරුණු ආශ්‍රයෙන් පමණක් අරමුණු සාධනය සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගෙන ඇති අතර අන්‍ය බෞද්ධ දාර්ශනික සම්ප්‍රදායන් පිළිබඳ අවධානය යොමු කොට නොමැත. මූලික වශයෙන් මෙම පර්යේෂණයේ දී තාර්කය පිළිබඳ බුද්ධ කාලීන පසුබිම අවබෝධ කර ගැනීමට අදාළ තොරතුරු ඉදිරිපත් කර ඇත. අනතුරුව තර්කය පිළිබඳ බෞද්ධ විග්‍රයත් එමෙන්ම සූත්‍ර පිටකය, අභිධර්ම පිටකය වැනි පිටකයන්හි අන්තර්ගත තොරතුරු ආශ්‍රිතව බුදුරජාණන් වහන්සේ භාවිත විවිධ තාර්කික ක්‍රමවේදයන් සහ ඉගැන්වීම් පිළිබඳව පෙන්වා දී ඇත.

## 'තර්ක' ශබ්දය පිළිබඳ අර්ථ විවරණ

උක්ත ප්‍රස්තුතයේ සංදර්භය තුළ දී තර්කය යන පදය පිළිබඳව විශේෂ වශයෙන් සාකච්ඡා කෙරේ. මෙනිසා තර්කය යනු කුමක්දැයි පළමුව අවබෝධ කරගත යුතුය. සමකාලීන භාරතීය ආගම් දර්ශනයන් විසින් සප්‍රමාණිකව පිළිගත් ඥානමාර්ග අතර ශ්‍රැති ප්‍රමාණය හා තර්ක ප්‍රමාණයට සුවිශේෂ ස්ථානයක් හිමි විය. එය හැඳින්වීමට සංස්කෘත භාෂාවෙන් **තර්ක්** ධාතුවෙන් නිපන් **තර්ක** යන පදය භාවිත වේ. මෙම සංස්කෘත පදයෙන් අනුමාන කිරීම, විවාදාත්මක විමර්ශනය, විචාරවත් කල්පනාව, භාෂා න්‍යාය, යමක් වටහා ගැනීමේ මාර්ගය, හරි වැරදි නිරීක්ෂණය කිරීමේ ක්‍රමය වැනි බොහෝ අර්ථ ගම්‍ය වේ.[5] මෙය ඉංග්‍රීසි භාෂාවෙන් **Logic** ලෙසින් හඳුන්වන අතර එය ලතින් භාෂාවේ **Logos** (සාකච්ඡා මූල ධර්ම, වාග් චාතුර්ය) යන පදයෙන් නිෂ්පන්නය.[6] තර්ක යන පදයේ පාලි ස්වරූපය **තක්ක** යන වචනය යි. එමඟින් තර්ක කිරීම, විතර්ක කිරීම, කථා කිරීම යනාදි අර්ථ ගෙන දෙයි.[7] තක්ක ශබ්දය විවිධ ස්වරූපවලින් පාලි ත්‍රිපිටකයෙහි යෙදී තිබේ. **තක්කී, වීමංසී, තක්කපරියාහත, තක්කායපත්තබ්බ, තක්කග්ගාහපටිපදා, තක්කාසය, තක්කහෙතු, තක්කවඩ්ඪිත, අතක්කාවචර, තක්කිකා, ධම්මතක්ක, තක්කාගම**[8] යනු ඉන් කිහිපයකි."[9] විචාරාත්මක චින්තනයේ පදනම පිළිබඳ අධ්‍යයනය මෙන් ම විවිධ ප්‍රස්තුතවල සැකැස්ම පිළිබඳ ගවේෂණය බුද්ධිවාදී තර්කනයේ දී අවධානයට ලක් කරයි.[10] සත්‍යය පිළිබඳ මිණුම ඉන්ද්‍රියානුසාරී නොව බුද්ධිමය හා නිගාමී බව තර්කයෙන් කියවෙයි. ස්වතඃසිද්ධ ප්‍රාගානුභූතික පූර්ව අවයව ඇසුරෙන් යම් නිගමනයකට එළඹීම තර්කයෙන් අදහස් කරන බව පාලි පෙළ පොත්වල ද දැක්වේ.[11]

## තර්කය පිළිබඳ බුද්ධකාලීන පසුබිම

බුද්ධ කාලීන භාරතය තුළ තර්කය භාවිත වූයේ කෙබඳු පරිසරයක් තුළ ද? යන්න වැදගත් කරුණක් සේ සැලකිය හැකිය. එකල සිටි බොහෝ මහණ බමුණෝ ස්වලබ්ධීන් ගොඩනැගීමටත් ඒවා ආරක්ෂා කරගැනීමටත් වෙනත් ක්‍රමයක් නොවූයෙන් තර්කය මත පදනම්ව වාදවිවාද මෙහෙය වූහ. එහි දී වාදයෙහි දක්ෂ වූවෝ අනිකුත් පිරිස පරදවා තම මතය සමාජය තුළ ස්ථාපිත කිරීමට උත්සාහ ගත්හ. මෙහි ප්‍රතිඵලයක් ලෙස බුද්ධ කාලය වන විට භාරතය නොයෙක් දෘෂ්ටීන්ගෙන් වියවුල් වූ දෘෂ්ටි ජාලාවක් බවට පත්ව පැවති අයුරු බ්‍රහ්මජාල සූත්‍රයෙන් මැනවින් ප්‍රකට වේ. මෙනිසා බුදු රජාණන් වහන්සේට පැවරුණු ප්‍රධාන කාර්ය නම් එම වියවුල නිරාකරණය කිරීමට පිළිගත හැකි සාධාරණ මාර්ගයක් ඉදිරිපත් කිරීමයි. එහි දී උන්වහන්සේ විසින් සිදු කරන ලද්දේ භාරතයට මහත් පිළිලයක් වූ ආදානග්‍රහීව තර්කයෙහි එල්බ සිටි පිරිස අඩපණ කරනු ලැබීමයි. ඒ සඳහා තර්කය අන්තගාමීව ගනිමින් සමාජය තුළ මිථ්‍යා දෘෂ්ටිය වැපිරූවන් නිර්දය ලෙස විවේචනය කරන්නට සිදු විය. තමන් වහන්සේගේ පළමු ධර්ම දේශනයෙන්ම එකී පරිසරය නිර්මාණය කිරීම ආරම්භ කළ අයුරු දම්සක් පැවතුම් සූත්‍රයෙන් අන්තවාදීන්ට එල්ල කළ ප්‍රබල විවේචනයෙන්ම ප්‍රකටවේ.

බුදු රජාණන් වහන්සේ, තර්කය අන්තගාමී ලෙස ග්‍රහණය කිරීම විවිධ මිථ්‍යා දෘෂ්ටීන්හි බැස ගැනීමට හේතුවක් ලෙසත්, එය සංසාර ගමන දීර්ඝ කරමින් අවිද්‍යාව

තුළ සත්ත්වයා නිමග්න කිරීමටත් හේතු වන සේ සලකා බැහැර කළ අවස්ථා බොහෝමයක් විමසිය හැකිය. තවද අන්තගාමීව තර්කයම ප්‍රාමාණික කොට ගනිමින් ලෝකය හා සත්ත්වයා පිළිබඳව නිගමන දීමට උත්සාහ ගත් සමකාලීන ආගමික දාර්ශනිකයන්ගේ අන්තගාමී දෘෂ්ටීන් දැඩිසේ විවේචනයට ලක් කළහ. "**මහණෙනි, මෙහි එක්තරා මහණෙක් හෝ බමුණෙක් හෝ තර්ක කරන්නේ වෙයි. ඒ ඒ කරුණින් තර්ක කොට විමසුම් නුවණ පමණින් කාරණය මැන ආත්මයත් ලෝකයත් සදාකාලිකය.....**"[12] යනුවෙන් තර්ක කරන බව දී.නි. බ්‍රහ්මජාල සූත්‍රයේ දී දක්වා ඇත. එය සත්‍ය ගවේශනයේ දී අනස්සාසික ධර්ම හෙවත් සතුට හෝ අවබෝධය නූපදවන ධර්ම ලෙස හඳුන්වා දුන්හ. මීට අමතරව සමකාලීන තර්කවාදීන් පිළිබඳව ම.නි සංගාරව සූත්‍රය හා සන්දක සූත්‍රය මෙන්ම අං.නි. කාලාම සූත්‍රයේ දී ද බොහෝ කරුණු පෙන්වා දී ඇත. සුත්ත නිපාතයේ දී ස්වදෘෂ්ටියෙහිම එල්බ තම මතය පමණක් නිවැරදි බවත්, අන්‍යයන්ගේ මත සාවද්‍ය බවත්, තමන්ම දක්ෂ බවත් ප්‍රකාශ කරමින් අනුන් සමඟ වාදයේ යෙදුණු බොහෝ මහණ බමුණන් පිළිබඳව තොරතුරු අනාවරණය වේ.[13] උදාන පාලියේ දී ලොව තාර්කිකයන් වැඩෙන්නේ බුදුවරයකු පහළ වනතුරු පමණක් බව මනහර නිදර්ශනයකින් පෙනවා දී ඇත. **(එවං ඔභාසිතමෙව තක්කිකානං - යාව සම්මා සම්බුද්ධො ලොකෙ නුපජ්ජන්ති)**[14]

මෙම ප්‍රස්තුතයේ දී වඩාත් වැදගත් වන සූත්‍රයක් ලෙස කාලාම සූත්‍රය පෙන්වා දිය යුතුය. එහි "**මා තක්කහේතු, මා නය හේතු, මා ආකාර පරිවිතක්කේන, මා දිට්ඨි නිජ්ඣානඛනතියා**"[15] යනුවෙන් දක්වා ඇති කරුණු පිළිබඳව මදක් විමසා බැලීම සප්‍රයෝජනය. "**මා**" යන නිපාතයෙහි ප්‍රතිෂේධාත්මක අර්ථයක් ඇතත් එයින් යමක් සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන බවක් නොඇඟවේ. කාලාම සූත්‍රයෙහි දැක්වෙන්නේ එකල භාරතයේ පැවති ප්‍රධාන ඥාන මාර්ග දහයකි. පැහැදිලිවම දැනුම ලබා ගැනීමට එම ඥාන මාර්ගයන්ගේ මහත් උපයෝගීතාවක් ඇති බව මදක් විමසා බැලීමෙන් හඳුනාගත හැකිය. එනිසා එම සියලු ඥාන මාර්ගයන් ප්‍රතික්ෂේප වුවහොත් සාමාන්‍ය ජනයා දැනුම ලබා ගන්නේ කෙසේද? යන ගැටලුව පැන නගී. මෙනිසා බුදු රජාණන් වහන්සේ එහි දැක්වෙන සියලු ඥාන මාර්ගයන් සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප නොකළ අතර ඒ කිසිදු කරුණක අත්තගාමීව එල්ලී, ස්ව විචාර බුද්ධිය මොට වීමට ඉඩ නොදෙන ලෙස උගන්වා ඇත. මෙම කරුණ තව දුරටත් ප්‍රකට කරනු වස් අටුවාචාරීන් වහන්සේලා ද ප්‍රයත්න දරා ඇත. **තක්කහෙතු** යන පදය අං.නි. අටුවාවේ දී තෝරා ඇත්තේ **තක්කගාහෙන** යනුවෙනි. එහි **ගාහෙන** යන පදයේ අර්ථය වන්නේ තර්කය මත පදනම්ව යන්නයි. හේතු යන පදයට P.T.S. ශබ්දකෝශයේ දී ලබා දී ඇති අර්ථය වන්නේ හේතුව කාරණය ප්‍රත්‍ය හෝ යෝග්‍යතාව යන්වෙනි.[16] මේ අනුව පෙනී යන්නේ තර්කය මත පමණක් පදනම්ව තීරණ ගැනීම බුදුදහම අපේක්ෂා නොකරන බවයි.

භාරතීය සමාජය තුළ බොහෝ පිරිසක් තර්කය මත පදනම්ව වාද විවාදයන්ට පැටලී ස්වමත සාධනයෙහි නිරතව සිටියහ. ජය අපේක්ෂා කරගෙන සිදු කරන ලද එවැනි වාද විවාද **ජල්ප** නමින් හඳුන්වා ඇත. එම අරමුණින් ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ,

ගෘහපති ආදීන් බුදු රජුන් සමග වාද විවාද සිදු කිරීමට පැමිණි අයුරු බොහෝ සෙයින් දක ගත හැකිය. චූළ දුක්ඛඛන්ධ සහ දේවදහ සූත්‍රවල දී ජෛනයන්ගේ පූර්ව කර්ම නියතිය ප්‍රතිබාහනය කිරීමට බුදුරජාණන් වහන්සේ තර්කය උපයෝගී කරගත් අයුරු දැක්වේ.[17] එහි ම එන අභයරාජකුමාර සූත්‍රය ඊට තවත් නිදසුනකි.[18] උපාලි ගෘහපතියා සහ බුදුරදුන් අතර ඇතිවූ සංවාදයේ දී බුදු හිමියන් අවධාරණය කරන්නේ වාදයකට එළඹෙන පුද්ගලයන්ගේ ප්‍රකාශ පරස්පර වීරෝධී භාවයෙන් දූෂිත නො වීය යුතු බවයි.[19] මෙහිදී උන්වහන්සේ සිහිපත්කර දෙන්නේ උපාලිගේ වදන්වලින් එම ඒකීය සහ සමරූපීභාවය ගිලිහී ගොස් ඇති බවයි. යම් වාද විවාදයන්හි දී ඉදිරිපත් කරන ප්‍රකාශනවල අතාර්කික බව බුදු රජාණන් වහන්සේ විවිධ අයුරින් පෙන්වා දුන් බව ත්‍රිපිටකයේ දැක්වේ.

(පුරෙ වචනං පච්ඡා අවචං - පච්ඡා වචනීයං පුරෙ අවචසහිතං මෙ අසංහිතං න බො තෙ සන්ධීයති, පුරමෙනවා පච්ඡිමං පච්ඡිමෙන වා පුරමං)

නිග්ණ්ඨනාථපුත්‍රතුමාගේ ශ්‍රාවක වූ සච්චක පඬිවරයා සහ බුදුරජාණන් වහන්සේ අතර ඇති වූ සංවාදයේ දී සච්චක පඤ්චස්කන්ධය ආත්මය වශයෙන් ගෙන වාදාරෝපණය කළේය. එහි සාවද්‍යතාව පෙන්වා දෙන බුදුන් වහන්සේ සච්චකගෙන් කරුණු විමසන්නේ පටිපුච්ඡා වෙය්‍යාකරණ ශෛලිය හෙවත් වාදාරෝපණය කළ තැනැත්තාගෙන් පෙරළා ප්‍රශ්න කිරීමේ ක්‍රමවේදයට අනුගතව ය. මෙහි දී ආත්මවාදයේ නිස්සාරත්වය ප්‍රකට කිරීම සඳහා ප්‍රශ්න නගන පිළිවෙළ සහ කරුණු ගෙනහැර දැක්වීම අතිශයින් ම තාර්කික ය.[20]

## තර්කය පිළිබඳ බෞද්ධ විග්‍රහය

බෞද්ධ සත්‍යෝක්ෂණ ක්‍රමවේදයේ දී තර්ක ප්‍රමාණයෙන් දක්වන කරුණක් සත්‍ය වීමේ සම්භාවිතාවක් බුදුරජාණන් වහන්සේ විසින් ම.නි සන්දක සූත්‍රයේ දී පෙන්වා දෙන ලදි.

01. සුතක්කිතං තථා

02. සුතක්කිතං අඤ්ඤතා

03. දුත්තක්කිතං තථා

04. දුත්තක්කිතං අඤ්ඤතා

වශයෙනි. මනාව තර්ක කොට නිවැරදි පිළිතුරක් ද, නිවැරදිව තර්ක කොට වැරදි පිළිතුරක් ද, වැරදියට තර්ක කොට නිවැරදි පිළිතුරක් ද, වැරදියට තර්ක කොට වැරදි පිළිතුරක් ද ලැබිය හැකි බව මෙයින් පෙන්වා දෙයි. නිවැරදි ලෙස තර්කය ගොඩනැගුවහොත් නිවැරදි පිළිතුරක් ලැබිය හැකි ය. තව දුරටත් මෙම කරුණ විග්‍රහ කරමින් ම.නි සන්දක සූත්‍රයේ දී අවයව මනාව ගැළපීමෙන් නිවැරදි තර්කයක් ගොඩනැගෙන අයුරු දක්වා ඇත. **(සුතක්කිතම්පි හොති)**[21] මෙහි දී වැදගත් වන කරුණක් නම් තර්කය තාර්කිකයා මත පදනම් වීමයි.

යමෙක් බුද්ධධර්මය අතක්කාවචර යැයි කියන්නේ නම් ඉන් ගම්‍ය වන ගැටලු රාශියක් පෙන්වා දිය හැකිය. එකක් නම් බුද්ධ ධර්මය අවයව මනාව නොපිහිටවා කර ඇති දේශනාවක් ද? යන්නයි. යම් කරුණක් අවයව මනාව පිහිටවා ඇත්නම් එය තාර්කික විය යුතුය. බුද්ධ දේශනාවන් දෙස බැලීමේ දී ලෞකිකව දේශනා කරන ලද සෑම කරුණක්ම පාහේ මනාව පිහිට වූ අවයවවලින් යුක්ත වන අතර එනිසාම ඒවායෙහි තාර්කික පදනමක් ද ඇත. අනෙක් කරුණ නම් ඉදිරිපත් කරන කරුණ එය ඉදිරිපත් කරන පුද්ගලයා මත පදනම් වීමයි. බුදු රජාණන් වහන්සේ දේශනා කළ ධර්මය අතක්කාවචර හෙවත් තර්කානුකුල නොවන්නේ නම් බුදු රජාණන් වහන්සේ අතාර්කිකව අතාර්කික දහමක් දේශනා කළේ ද? යන්න තවත් ගැටලුවකි. නමුත් එය සිදු විය නොහැක්කක් බව බොහෝ බුද්ධ දේශනා තුළ පවත්නා තාර්කිකත්වය තුළින් ප්‍රකට වේ.

දී.නි. අටුවාවේ දී භාරතයේ සිටි තාර්කිකයින් වර්ග හතරකට (04) බෙදා දක්වා ඇත.

01. අනුස්සුතික

02. ජාතිස්සර

03. ලාභී

04. ශුද්ධ වශයෙනි.

මෙයින් සිවුවෙනි තාර්කිකයන් වන ශුද්ධ තාර්කිකයන් තර්කයම පදනම් කරගත්ත ද ඔවුහු බුදුදහමේ ප්‍රමුඛ දේශනාවක් වන පටිච්චසමුප්පාද දේශනාව **එවං සති ඉදං හොති , එවං අසති ඉදං න හොති** යන න්‍යාය භාවිත කරති. බුදු දහමේ මූලිකම දේශනාව වන පටිච්ච සමුප්පාදය එසේ ප්‍රබල තාර්කික පදනමකින් යුත්ත වීමෙන් පෙනී යන්නේ ඒ මත ගොඩනැගී ඇති සියලු දේශනා තාර්කිකත්වය භජනය කරන බවයි. පටිච්ච සමුප්පාදය අනුලෝම පටිලෝම ක්‍රමයකට දේශනා කොට ඇත. න්‍යාය ශාස්ත්‍රයේ දී අනුලෝම ක්‍රමය **අන්වය** නමින් ද පටිලෝම අංශය **ව්‍යතිරේක** නමින් ද දක්වා ඇත. ඒ අනුව අන්වයෙන් සහ ව්‍යතිරේකයෙන් යුක්ත වූයේ **ව්‍යාප්තියක්** බව න්‍යාය ශාස්ත්‍රයේ දී දැක්වේ.[22] මජ්ඣිමනිකායේ බොහෝ සූත්‍රයන්හි දී ද මෙම ව්‍යාප්තිය පිළිබඳව පිළිවෙළින් පැහැදිළි කොට ඇත.[23]

කර්මය හා පුද්ගල විශුද්ධිය පිළිබඳ බ්‍රාහ්මණයන් පිළිගත් උදකාවරෝහණය හෙවත් දියේ ගිලීම අර්ථ ශූන්‍යවූවක් බව සෝපාසාත්මකව බැහැර කළේ තාර්කික සිද්ධාන්තයක් මත රඳා සිටීමෙනි. මෙහි තාර්කික ස්වරූපය කේ. එන්. ජයතිලකයන් විසින් ද පෙන්වා දී තිබේ. ජලයේ ගිලීමෙන් අභ්‍යන්තර පාරිශුද්ධිය ලද හැකි නම් සැමකල්හි ම දියෙහි ජීවත්වන මැඩියන්, ඉබ්බන්, කිඹුලන් ආදි සතුන් ද ස්වර්ගපරායන නොවන්නේ දැයි මෙහිදී ප්‍රශ්න කෙරේ."[24]

තර්කය සත්‍යාවබෝධය පිණිස ප්‍රමාණයක් නොව එය ප්‍රත්‍යාත්ම වේදනීය වශයෙන් කළ යුතුය. නමුත් එයින් සත්‍යය වටහා දීමට ගැටලුවක් නොවේ.

බුදුරජාණන් වහන්සේ සිදු කරන්නේ ද තත් කර්තව්‍යයමය. උදාරණයක් ලෙස අනාත්ම සංකල්පය ඉතාමත් ගැඹුරු මෙන්ම සත්‍යාවබෝධයට අතිශයින් අවශ්‍ය වන ධර්මයකි. එය තර්කයෙන් අවබෝධ කරගත නොහැකි ය. තර්කය ප්‍රාමාණිකව ගෙන ආත්ම සංකල්පය අවබෝධ කිරීමට යාම හේතුවෙන් ශාස්වත අශාස්වත ආදි බොහෝ දෘෂ්ටීන් ඇතිවන අයුරු පෙළ සාහිත්‍ය තුළ බහුලව දක්නට ලබේ. නමුත් මෙම අනාත්මවාදී බෞද්ධ ඉගැන්වීම සත්ත්වයාට පහදා දීම සඳහා බුදු රජාණන් වහන්සේ තාර්කික ක්‍රමයක් අනුගමනය කළ බව අනත්ත ලක්ඛණ සූත්‍රයෙන් පැහැදිලි වේ. ඒ මුලින් ඵලය දක්වා පසුව එයට හේතු දැක්වීමේ ක්‍රමයයි.[25] ත්‍රිලක්ෂණය පිළිබඳ දේශනාවේ දී "**චක්ඛුං භික්ඛවෙ අනිච්චං, යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා**" යන පාඨයෙහි අන්තර්ගත වන්නේ ද මෙම තාර්කික සිද්ධාන්තය යි.[26] චතුරාර්ය සත්‍ය දේශනාව තුළදී ද දුක නම් වූ ඵලය පළමුව දක්වා අනතුරුව දුකට හේතු පිළිබඳව විවරණය කරමින් මෙම තාර්කික සිද්ධාන්තයම අනුගමනය කර ඇත.[27]

බුදුරජාණන් වහන්සේ ඇතැම් ධර්ම කාරණා පැහැදිලි කිරීම සඳහා චතුෂ්කෝටික න්‍යාය භාවිත කළ බව උගත්හු පෙන්වා දෙති. මේ පිළිබඳව බොහෝ නිදර්ශන සූත්‍ර සාහිත්‍ය තුළින් පෙන්වා දිය හැකිය. බුදුරජාණන් වහන්සේ ලෞකික කරුණු විෂයෙහි චතුෂ්කෝටික න්‍යාය භාවිත කළ ආකාරයක් ම.නි කන්දරක සූත්‍රයේ දක්නට ලැබෙයි.

**අත්තන්තපො** (තමන්ට වද දෙන පුද්ගලයා)

**පරංතපො** (අනුන්ට වද දෙන පුද්ගලයා)

**අත්තංතපො ච පරංතපො ච** (තමන්ටත් අනුන්ටත් වද දෙන පුද්ගලයා)

**නෙව අත්තංතපො ච න පරංතපො ච**[28] (තමන්ටත් අනුන්ටත් වද නොදෙන පුද්ගලයා)

මෙවන් බොහෝ අවස්ථාවන් තුළ දී බුදුරජාණන් වහන්සේ චතුෂ්කෝටික ක්‍රමය ප්‍රකට කළ අයුරු ත්‍රිපිටකයේ දක්නට ලැබේ.

තර්ක ශාස්ත්‍රයට පරිභාෂාවක් (termilogy) ඇත. බුදු දහම තුළ තර්ක ශාස්ත්‍රයේ දී භාවිත වන එවන් බොහෝ පාරිභාෂික වචන (technical terms& විවිධ උපයෝගීතාවන්ගෙන් යුතුව භාවිත වී ඇති අයුරු හඳුනාගත හැකිය. **(පමාණ, පමාණික, තක්කී, තක්ක, තක්කික, ඤාය, නය, වීමංසා, වීමංසක, පමාණ,)** ආදි බොහෝ වචන ප්‍රමාණයක් පෙළ තුළ භාවිත වීමෙන් ප්‍රකට වන්නේ බුදු රජාණන් වහන්සේ තර්ක ශාස්ත්‍රය සම්බන්ධයෙන් පුළුල් අවබෝධයකින් යුක්ත වූ බවත්, එය කරුණා පරවශව යමෙකුට ධර්මය අවබෝධ කර දීම සඳහා භාවිත කිරීමත් වරදක් නොවන බවයි. බුදු සමය තුළ තර්කය සහේතුක බව යන අර්ථයෙන් භාවිත වී ඇත. අනුන් විසින් ඉදිරිපත් කරනු ලබන වාද සහේතුකව හෙවත් තාර්කිකව විසඳිය යුතු බව සං.නි. දක්වා ඇත. **(උප්පන්නං පරප්පවාදං සහ ධම්මේන සුනිග්ගහීතං**

**නිග්ගහිත්වා සප්පටිහාරියං ධම්මං දෙසෙති)** යනුවෙනි. තවද ප්‍රඥාව මැන ගැනීමට ඇති වැදගත්ම නිර්ණායකයක් ලෙස බුදු රජාණන් වහන්සේ සාකච්ඡා කිරීම හෙවත් දෘෂ්ටීන්හි නොඑල්බී වාද කිරීම පෙන්වා දී ඇත. **(සාකච්ඡාය භික්ඛවෙ පඤ්ඤා වේදිතබ්බා)** යනුවෙන් තත් කාරණය ප්‍රකට වේ.

## තර්කය පිළිබඳ අභිධර්මාගත විග්‍රහය

තර්කය යනු බුදු දහමේ ඉගැන්වෙන දෙපණසක් (52) වූ චෛතසික ධර්මයන් අතරින් එක් චෛතසිකයකි. එය **විතක්ක** චෛතසිකයයි. **(කතමො තස්මිං සමයෙ විතක්කෝ හොති? යො තස්මිං සමයෙ තක්කෝ විතක්කෝ සංකප්පෝ අපප්නා ව්‍යපනා චෙතසො අභිනිරොපනා සම්මා සංකප්පෝ)**[29] තර්කයෙන් තොරව සත්ත්වයාට විවේකඥානයක් ඇතිවිය නොහැකි බව දක්වේ.[30] එයට හේතුව වශයෙන් ව්‍යවහාරික ලෝකයේ මුහුණ පාන්නට සිදුවන දහසක් උභතෝ කෝටික ප්‍රශ්නයන්ට පිළිතුරු ලබා ගත හැකි වන්නේ තර්කානුසාරයෙන් වීමයි'[31] තර්කනය සත්වයාට සහජයෙන් හිමි වූ දෙයකි. මිනිසාට පමණක් නොව වෙනත් තිරිසන්ගත සත්ත්වයන්ට ද තර්ක ඥානය ඇත. එහෙත් ප්‍රඥාව ඇත්තේ මිනිසාට පමණි.[32] ලොව චින්තනයක් ඇති සියලු සත්වයාට උරුම වූ තර්කන හැකියාව බුදු දහම තුළින් ප්‍රතික්ෂේප කිරීමට නොහැකි ය.

ලෞකිකත්වය ඉක්මවමින් ලෝකෝත්තරත්වයට ප්‍රවිශ්ට වන ප්‍රථම ධ්‍යාන ලාභියා පවා තම සිතුවිලි මෙහෙය වීමට තර්කය උපයොගී කර ගනියි. ප්‍රථම ධ්‍යාන ලාභියාට තම සිතුවිලි හැසිරවීමට තර්කය අවශ්‍ය බව දී.නි කස්සප සීහනාද, ම.නි. නිවාප වැනි සූත්‍රවලදී පෙනවා දී ඇත. **(සවිතක්කං සවිචාරං විවේකජං පීති සුඛං උපසම්පජ්ජ විහරති)** මෙපමණක් නොව යම් කිසි කරුණක සත්‍යාසත්‍යතාවය විමර්ශනය කිරීමට ඇති නිර්ණායකය ද තර්කයයි. **(තක්කං ච දිට්ඨීසු පකප්පයිත්වා - සච්චං මුසාති ද්වය ධම්මමාහු)**[33] දෛනික ජීවිතයේ දී වුව ද මුහුණ පාන්නට සිදුවන බොහෝ ගැටලුවලට තර්කානුසාරීව විසඳුම් ලබා දීමට සිදු වේ. උදාහරණයක් ලෙස අද දහවල් ආහාරය සඳහා කුමක් සම්පාදනය කරන්නේද යන්න ගෘහණිය තීරණය කරන්නේ තර්කානුසාරීවය

## සූත්‍රපිටකයේ පැනෙන තාර්කික ක්‍රමවේද

මූලික ථේරවාදී සූත්‍රදේශනාවන් පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයේ දී පෙනී යන කරුණක් නම් එම දේශනාවන් තුළ භාවිත විවිධ තාර්කික ක්‍රමවේදයන් පවතින බවයි. මෙහි දී ඒ පිළිබඳ යම් අවබෝධයක් ලබා ගැනීම ද මුල් බුද්ධ දේශනාවන්හි තර්කයට හිමි ආස්ථානය හඳුනාගැනීම සඳහා ඉවහල් වේ. මෙහි දී හැගොඩ ඛේමානන්ද හිමි ථේරවාද බෞද්ධ න්‍යාය ශාස්ත්‍රයේ පැනෙන පටිච්ච සමුප්පාදය පදනම් කරගත් න්‍යායන් කිහිපයක් ඉදිරිපත් කර ඇත. ඒ ආශ්‍රයෙන් සූත්‍ර පිටකය පුරාවට බුදුරජාණන් වහන්සේ විසින් භාවිත තාර්කික ක්‍රමවේදයන් හෙවත් න්‍යායන් පිළිබඳ අවබෝධයක් ලබාගත හැකිය.

## යත්තත් නය ('Whatever……… That' method)

මෙයින් විග්‍රහ වන්නේ පාලි භාෂාවේ පැනෙන "ය" සහ "ත" ශබ්දයන් උපයෝගී කරගනිමින් පටිච්ච සමුප්පාදයට අයත් සංකල්ප විග්‍රහ කිරීමයි. නිදර්ශනයක් ලෙස "**යං කිංචි සමුදය ධම්මං සබ්බං තං නිරෝධ ධම්මං**" යන ප්‍රකාශය පෙන්වා දිය හැකිය. යම්කිසිවක් හටගන්නා ස්වභාව ඇත්තේ ද, ඒ සියල්ල නැතිවෙන ස්වභාව ඇත්තේ යනු එම ප්‍රකාශයෙහි අර්ථයයි. මීට අමතරව "**යං අනිච්චං තං දුක්ඛං**" යන ප්‍රකාශය ද නිදර්ශනයකි. මෙහි අර්ථය වන්නේ යමක් අනිත්‍ය ද එය දුක් සහිතය යන්නයි. ඒ අනුව පෙනී යන්නේ යමක් අනිත්‍ය ස්වභාවයෙන් යුක්ත වන්නේ නම් එය දුක්වන බව හේතුඵල න්‍යායානුසාරීව විග්‍රහ කළ හැකි බවයි. මෙනයින් ඕනෑම කරුණක් විග්‍රහයට ලක් කළ හැකිය.

## චෙත් නය (If method)

හේතුඵල සංකල්පය පිළිබඳව පැනෙන ඇතැම් බුද්ධ දේශනාවන් මෙකී චෙත් නය හෙවත් අසම්භාව්‍ය ක්‍රියාවන් ආශ්‍රයෙන් ද විග්‍රහ කර ඇති ආකාරය සූත්‍ර දේශනාවන්හි දැකගත හැකිය. නිදර්ශන ලෙස "**නො චෙ පඨවිධාතුයා අස්සාදෝ අභවිස්ස**" මෙහි අර්ථය වන්නේ ඉදින් පඨවි ධාතුවෙහි ආස්වාදයන් නොවන්නේ නම් සත්ත්වයෝ එහි නොඇලෙන්නෝය. යන්නයි. බේමානන්ද හිමි පෙන්වා දෙනු ලබන තවත් නිදර්ශනයක් නම්

**සචෙ භායථ දුක්ඛස්ස සචෙ තෙ දුක්ඛමප්පියං**

**මා කත්ථ පාපකං කම්මං ආවි වා යදි වා රහො**

යන්නයි. එහි අර්ථය වන්නේ ඉදින් දුකට බිය නම් අප්‍රිය නම් එළිපිට හෝ රහසින් හෝ පව් නොකරනු යන්නයි. මෙවන් ප්‍රස්තුත වර්ග පිළිබඳව බටහිර තර්කශාස්ත්‍රයේ දී ද සෝපාධික ප්‍රස්තුත ලෙස සාකච්ඡාවට භාජනය වේ. මෙම තර්කය ඇරිස්ටෝටලියානු තර්ක ශාස්ත්‍රය ඇසුරින් රූපිකත්වයට ද නැගිය හැකිය.

සංක්ෂේපණ රටාව

දුකට බිය වේ - P

එළිපිට පව් කරයි - Q

රහසින් පව් කරයි - R

සංකේතකරණය

P N (Q V R)

P

N (Q V R) යනුවෙනි.

## කාලාර්ථ නය (Temporal method)

මෙම න්‍යායේ දී භාවසත්තමී අර්ථයෙන් පටිච්ච සමුප්පාදය ඉදිරිපත් වන ආකාරය පෙන්වා දෙනු ලැබේ. එනම් කාලාර්ථ ක්‍රියාවයි. "**ඉමස්මිං සති ඉදං හෝති, ඉමස්මිං අසති ඉදං න හොති**" යනුවෙනි. මෙහි අර්ථය වන්නේ මෙය ඇති කල්හි මෙය වේ. මෙය නැති කල්හි මෙය නොවේ. මීට අමතරව "**අවිජ්ජාය සති සංඛාරා හොන්ති**" අවිද්‍යාව ඇති කල්හි සංස්කාර වේ. යනු එහි අර්ථයයි. සප්තමී අර්ථයෙන් හේතුඵල නියමය උක්ත පරිදි ත්‍රිපිටකය තුළ නොයෙක් ස්ථානයන්හි ඉදිරිපත්ව ඇත.

## විභංග නය (Analitical method)

**විශ්ලේෂී ක්‍රමය බුදුරජාණන් වහන්සේ නොයෙක් අවස්ථාවන්හි දී ධර්ම කරුණු නිරවුල්ව පැහැදිලි කිරීම සඳහා භාවිත කොට ඇත. විභංග යනුවෙන් මෙහි දී හඳුන්වනු ලබන්නේ ද එම විශ්ලේෂී ක්‍රමයයි. පටිච්ච සමුප්පාදය හා සම්බන්ධව විමසීමේ දී පෙනී යන්නේ ධර්ම බෙදා හේතු ඵල දැක්වීම බුදුරජාණන් වහන්සේ විසින් සිදු කර ඇති බවයි. බටහිර තර්ක ශාස්ත්‍රයේ දී ප්‍රධාන වශයෙන් ප්‍රස්තුත වර්ග දෙකක් හඳුනාගැනෙයි. ඒ සාමාන්‍ය ප්‍රස්තුත සහ විශේෂ ප්‍රස්තුත වශයෙනි. සාමාන්‍ය ප්‍රස්තුත මගින් කිසියම් සමස්තයක් පිළිබඳ කියැවෙන අතර විශේෂ ප්‍රස්තුතයන්ගෙන් කියැවෙන්නේ විශේෂ වූ පුද්ගලයෙක් හෝ දෙයක් පිළිබඳවය ඒ අනුව බුද්ධ දේශනාව තුළ ද** "**සබ්බ**" හෙවත් සියල්ල අර්ථවත් වන සාමාන්‍යයන් "**එකච්ච**" හෙවත් විශේෂ වශයෙන් දැක්වීමේ ක්‍රමය පටිච්ච සමුත්පාදය පිළිබඳ විග්‍රහයන්හි දී ඉදිරිපත් කොට ඇත. නිදර්ශනයක් ලෙස "**තයෝ මේ පුග්ගලා අන්ධො එකචක්ඛු ද්විචක්ඛු**" යනුවෙනි. මෙම විග්‍රහයට අනුව පුද්ගලයා යන්න සාමාන්‍ය වන අතර එම පුද්ගලයා විශ්ලේෂණය කිරීමෙන් අන්ධ, ඒකචක්ඛු සහ ද්විචක්ඛු යන පුද්ගලයන් තිදෙනා විශේෂ වශයෙන් දැක්වෙන බව ඛේමානන්ද හිමි පෙන්වා දී ඇත.

## අන්වය නය නොහොත් නයග්ගාහය (Syllogistic method)

ප්‍රත්‍යක්ෂ වූ දෙයක් ආශ්‍රයෙන් අප්‍රත්‍යක්ෂ වූ දෙයක් පිළිබඳ කෙරෙන අනුමානය මෙහි දී සාකච්ඡා වේ. මෙහි අන්වය යන්නෙන් බෞද්ධ තර්කශාස්ත්‍රයේ ඉගැන්වෙන ස්වාර්ථානුමානය අදහස් වෙයි. එනම් යමක් පිළිබඳව තමන් තමන් උදෙසා ලබන අනුමාන ඥානයයි. නයග්ගාහ යනු පරාර්ථානුමානයයි. එනම් තමන් යමක් පිළිබඳ ලද ඥානය භාෂාත්මකව අන්‍යන් වෙත ලබා දීමයි. මෙම නයග්ගාහ යන වචනය අටුවාචාරීන්ගේ වචනයක් බව ඛේමානන්ද හිමි පෙන්වා දී ඇත. මෙම අනුමානමය සංවාක්‍යයක ස්වරූපයෙන් පටිච්ච සමුප්පාදය හෙවත් හේතුඵල වාදය ඉදිරිපත් කළ හැකිය. නිදර්ශනයක් ලෙස "**යදනිච්චං තං දුක්ඛං**" යන්න මත පදනම්ව ප්‍රත්‍යක්ෂ වූ අනිත්‍ය යමක් ආශ්‍රයෙන් එහි දුක්ඛ ස්වභාවය අනුමාන කළ හැකිය. ඇස අනිත්‍ය බව ඕනෑම කෙනෙකුට ප්‍රත්‍යක්ෂ වේ. මේ අනුව එය දුක නමැති ඵලය නිර්මාණය කරන ආකාරය සංවාක්‍යාත්මකව පහත පරිදි ඉදිරිපත් කළ හැකිය.

චක්ඛුං අනිච්චං (ඇස අනිත්‍යය) - හේතුව

යං අනිච්චං -

තං දුක්ඛං - ඵලය

මෙහි දී සිදුව ඇත්තේ ප්‍රත්‍යක්ෂමය වූ හේතුව ආශ්‍රයෙන් අප්‍රත්‍යක්ෂ වූ ඵලය අනුමාන කිරීමයි. මෙනයින්ම මෙම ඥානය පදනම් කරගෙන වෙනත් දේ පිළිබඳ ඥානය ද අනුමාන කළ හැකිය. "**යං දුක්ඛං තං අනත්තා**" යමක් දුක් සහිත නම් එය අනාත්මය යන්න එහි අර්ථයයි.

## උපමා නය (Simile method)

යමක් වටහා දීම සඳහා උපමාවක් භාවිත කිරීම පිළිබඳ මෙහි දී අදහස් වෙයි. උපමාවක් සහ උපමේයක් පදනම් කරගනිමින් කිසියම් ධර්ම කාරණයක් පැහැදිලි කර දීම මෙහි දී සිදු වෙයි. බුදුරජාණන් වහන්සේ නොයෙක් අවස්ථාවන්හි දී උපමා ආශ්‍රයෙන් ධර්ම කරුණු පැහැදිලි කර ඇත. එමගින් ඉතා ගැඹුරු සංකල්පයක් වුවද පහසුවෙන් අවබෝධ කිරීමේ හැකියාව පවතියි. නිදර්ශනයක් ලෙස "**සෙය්‍යථාපි භික්ඛවේ කුම්භො නික්කුජ්ජෝ වමතෙව උදකං නො පච්චාවමති, එවමෙව බො භික්ඛවෙ භික්ඛු භාවෙන්තො අරියං අට්ඨංගිකං මග්ගං වමතෙව පාපකෙ අකුසලෙ ධම්මේ නො පච්චාවමති**" පහළට හැරවූ කළය වතුර වගුරුවන්නාක් මෙන් අරි අටඟි මග වඩන භික්ෂුව අකුසල් දහම් ඉවතලන බව මෙයින් කියැවේ. කළයක් අනික් පැත්ත හැරවීමේ දී එයින් වතුර වැහෙන බව පූර්වයෙන් දැන සිටින පුද්ගලයා ඒ ආකාරයෙන්ම ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩීමෙන් තමන් තුළ පවත්නා කෙලෙස් ද ඉවත් වන ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා ගනු ලබයි.

සෑම උපමා උපමේයක්ම හේතු ඵල වශයෙන් විග්‍රහ කිරීමට හැකිය. උපමාව හේතුව වන අතර ඵලය වන්නේ උපමේයයි. එයින් සිදු වන්නේ එක් දැනුමක් පදනම් කරගනිමින් තවත් දැනුමක් ලබාගැනීමයි. පාලි සාහිත්‍ය තුළ පැනෙන එවන් උපමා උපමේයන් න්‍යායන් වශයෙන් හැඳින්වෙන අතර එවන් න්‍යායන් කිහිපයක් පහත පරිදි ඛේමානන්ද හිමි විසින් පෙළ ගස්වා ඇත. **අන්ධපංගුනය, සීහාවලෝකනනය, මණ්ඩූකගතිනය, නදීසෝතනය, නාවාසටක නය, රුක්ඛසකුනනය, කකොලොකනය, චන්දකාන්තනය, මිගපදවලඤ්ජනනය** යනාදිය ඉන් කිහිපයකි.

## සමාලෝචනය

උක්ත කරුණු සියල්ල දෙස සාවධානය යොමු කරන විට පෙනී යන්නේ බුදුදහම කොතරම් තාර්කිකව දේශනා කරන ලද දහමක් ද යන්නයි. බුදු රජාණන් වහන්සේ භාෂාව හා තර්කය අතර පැවති සම්බන්ධය අවබෝධ කරගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් භාෂාව නිවැරදිව භාවිත කිරීමේ අනුසස් ද පෙන්වා දුන්හ. බෞද්ධ තර්කනයේ දී පද භාවිතය මෙන් ම එම පදවලින් ගම්‍ය වන අර්ථ කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වයි. යම් පදයකින් අර්ථවත් වන අදහස මෙන් ම එහි වචන

භාවිතය ද ව්‍යාකරණානුකූලව නියමිත සහ නිවැරදි ක්‍රමයකට අනුව සිදුවිය යුතුය. මහාකම්මවිභංග සූත්‍රයේ දී "**සඤ්චේතනිකං කම්මං**" යන ව්‍යවහාරයේ පවත්නා නො පැහැදිලි බව සහ එයට නිවැරදි අර්ථ කථනයක් ඉදිරිපත් කළ නො හැකි බව නිසා "**සඤ්චේතනිකං කුසලකම්මං, අකුසලකම්මං**" ආදි වශයෙන් කර්ම බෙදා වෙන්කරගත යුතු අයුරුත් විස්තර කෙරේ.[34] තර්කය සඳහා ප්‍රමුඛ මෙවලම වන්නේ භාෂාවයි. භාෂාවේ දුර්වලතා හෝ භාවිතයේ දී මතුවන නොගැළපීම නිසා යමක් සහේතුකව විමර්ශනය කිරීමේ අපහසුතා ඇතිවේ. අග්ගිවච්ඡගොත්ත සූත්‍රයේ දි භාෂාවේ වැරදි ව්‍යවහාරය පදනම් කරගෙන මතුවන ගැටලු පැහැදිලි කර ඇත. මරණින් මතු රහතන් වහන්සේලාගේ ස්වභාවය පිළිබඳ මතුකරන ලද ප්‍රශ්න "**න උපෙති**" නොගැලපෙන බව දක්වේ.[35] මේ අනුව භාෂාව නිවැරදිව තර්කානුකූලව භාවිත කළ යුතු බව පෙන්වා දී ඇත. අනවශ්‍ය පරිදි භාෂාවට ආසක්ත වීමෙන් ආධ්‍යාත්මික සංවර්ධන ක්‍රියාවලියේ දී සිදුවිය හැකි දුෂ්කරතා පිළිබඳව ද බුදුදහම පෙන්වා දෙයි.[36]

අවසන් වශයෙන් සමෝධානය කළ හැක්කේ බුදුරජාණන් වහන්සේ තර්කය ප්‍රතික්ෂේප කළේ එය ආදානග්‍රාහීව ගැනීම තුළ විවිධ දෘෂ්ටීන් භජනයට අවකාශ සැලසෙන හෙයිනි. එම අර්ථයෙන් උන්වහන්සේ තර්කය ප්‍රතික්ෂේප කිරීම තුළින් සමස්ත බුද්ධධර්මය තර්කානුකූල බවකින් යුක්ත නොවන බව ප්‍රකාශ කළ නොහැකි ය. යමක් භාෂාව මාධ්‍ය කරගනිමින් ප්‍රකාශ කළ හැකි නම් ඒ සියල්ල තර්කානුකූල විය යුතුය. එසේ නම් බුදුදහමට අනුව භාෂාව නම් වූ ලෞකික මෙවලමෙන් ප්‍රකාශ කළ නොහැකි වූ නිවන අතාර්කිකය. එය තර්කය තුළින් අවබෝධ කිරීමට හෝ ප්‍රකාශ කිරීමට යාම තුළ විවිධ මිථ්‍යා දෘෂ්ටීන් ඇති විය හැකි ය. බුදුදහම තර්කය එකම ඥාණ මාර්ගය වශයෙන් පිළිනොගන්නා අතර තමන් තර්කානුසාරීව අවබෝධ කරගත් දෙය ප්‍රත්‍යාත්ම වශයෙන් ප්‍රත්‍යක්ෂ කරගත යුතු බව පෙන්වා දෙයි. තර්කය සියලු දෙනාටම අවශ්‍ය නමුත් රහතන් වහන්සේට තර්කයේ කිසිදු උපයෝගීතාවක් නොමැති බව ධර්මයේ දැක්වේ. මේ අනුව ව්‍යවහාරික ලෝකයේ ජීවත් වන සියලු දෙනා තර්කය උපයෝගී කරගත යුතු නමුත් එය ආදානග්‍රාහීව අල්ලා ගැනීම තුළ විවිධ දෘෂ්ටි හා ගැටුම් ඇතිකරගනිමින් අන්තවාදී නොවිය යුතු බව බුදු දහමෙන් පෙන්වා දෙයි.[37]

## ආන්තික සටහන්

1 *සං. නි. ඛන්ධ සංයුත්තය* P.T.S පිට 03.96

2 *ම.නි. 2, චංකී සූත්‍රය* 660 (බු.ජ.මු)

3 *පපඤ්චසූදනී අටුවා*, (1917) පිට 3779

4 තක්කඤාණස්ස අගෝචරතෝ අතක්කාවචරෝ.....*ඉතිවුත්තක අට්ඨකථා* 1 P.T.S 164 පිට

5 සෝරත හිමි, වැලිවිටියේ. (1985) *ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය 10 කාණ්ඩය*, ගොඩගේ, කොළඹ: පිට 485.

6 *English, Chinese and Greek Dictionary* (1985) Beijing, p.568.

7 *ව්‍යාකරණ සද්ද සින්ධු-ii* (1931), පිට 128.

8 ඛේමානන්ද හිමි, හැගොඩ (1992), පිට 85

9 *P.T.S. Dictionary*, London: p. 292.

10 *Universal Dictionary*, (1988) London: p. 907.

11 කරගම්පිටියේ සුමනසාර සංස්කරණය, (1953), පිට 75.

12 *දී.නි. 01* බ්‍රහ්මජාල සූත්‍රය, පිට P.T.S. 16

13 *සුත්ත නිපාතය* 882 ගාථාව.

14 *උදාන පාලි* – P.T.S p. 73

15 *අං.නි.* කාලාම සූත්‍රය බු.ජ.මු. 1960 පිට 336

16 *P.T.S Dictionary*, Ed: 2001, p. 733.

17 *ම.නි. 3* දෙවදහ සූත්‍රය, පිට. 03, චුල්ලදුක්ඛක්ඛන්ධ සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මා.පිට. 277.

18 "තං කිස්ස හෙතු, අත්ථි මෙ භන්තෙ කුමාරෙ අනුකම්පාතිග එවමෙව ඛො රාජකුමාරල යං තථාගතො වාචං ජානාති අභූතං අතච්චං අනත්ථසංහිතං, සා ච පරෙසං අප්පියා අමනාපා, න තං තථාගතො වාචං භාසති" *ම.නි. 2* අභයරාජකුමාර සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මා. පිට. 96.

19 "න ඛො තෙ සන්ධීයති පුරිමෙන වා පච්ඡිමං පච්ඡිමෙන වා පුරිමං "
*ම.නි. 2* උපාලි සූත්‍රය බු.ජ.ත්‍රි.ග්‍ර.මා. පිට. 70.

20 *ම.නි. 1* චූළසච්චක සූත්‍රය බු.ජ.ත්‍රි.ග්‍ර.මා. පිට. 70.

21 *ම.නි. - 02* සන්දක සූත්‍රය, බු.ජ.මු. 1973, පිට 322

22 අභයසිංහ (1961), පිට 127

23 *ම.නි. - 01* මහාතණ්හා සංඛය සූත්‍රය බු.ජ.මු පිට 612

24 "කොනු තෙ ඉදමකාසි අජානන්තස්ස අජානතො
දකාභිසෙචනා නාම - පාපකම්මා පමුච්චති
සග්ගං නූන ගමිස්සන්ති - සබ්බෙ මණ්ඩූකකච්ඡපා
නක්කා ච සුංසුමාරා ච - යෙ චඤ්ඤෙ උක්කෙ චරා
*ථේරීගාථා*, එන්. ඒ. ජයවික්‍රම සංස්කරණය, 1967, පිට. 29.

25 රූපං භික්ඛවෙ අනත්තා, රූපං භික්ඛවෙ අත්තා අභවිස්ස, නයිදං රූපං ආබාධාය සංවත්තෙය්‍ය යස්මා ච ඛො භික්ඛවෙ රූපං අනත්තා, තස්මා රූපං ආබාධාය සංවත්තති."
*මහාවග්ග පාලි*, දෙහිගස්පේ පඤ්ඤාසාර සංස්කරණය කොළඹ: 1958, පිට. 12.

26 *සං.නි. 4* අජ්ජත්තානිච්ච සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මා. පිට. 02.

27 *ම.නි. 3* සච්චවිභංග සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මා. පිට. 514.

28 *ම.නි.* කන්දරක සූත්‍රය බු.ජ.මු. 1984

29 ඛේමානන්ද හිමි, හැගොඩ (1992), පිට 87

30 අභයසිංහ (1961), පිට 01

31 සාසනරතන හිමි මොරටුවේ, *බෝධිචර්යාවතාරය*,

32 But are not reasoning and wisdom surely much the same? Certainly not, reasoning is one thing, wisdom is another. Sheep and goats, oxen………… have reasoning. But wisdom they have not.

(English translation – Milinda panna. P.T.S p.p. 50-51 )

33 *ඛු.නි* සුත්තනිපාතය P.T.S. 173 ගාථා 892

34 *ම.නි. 3* මහාකම්මවිභංග සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මා. පිට. 446.

35 *ම.නි. 2* අග්ගිවච්ඡගොත්ත සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මා. පිට. 258.

36 Sumanapala. G.D, (1998), p. 40.

37 "ඉමා ඛො චිත්ත ලොකසමඤ්ඤා ලොකනිරුත්තියො ලොක වොහාරො ලොකපඤ්ඤත්තියො යානි තථාගතො වොහරති අපරාමසන්ති. *දී.නි. 1* පොට්ඨපාද සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මා. පිට.436

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1 අභයසිංහ, (1961), *භාරත තර්ක ශාස්ත්‍රය,* මහාබෝධි යන්ත්‍රණාලය, කොළඹ.

2 ඛේමානන්ද හිමි, හැගොඩ. (1993), *ථෙරවාදී න්‍යාය,* කරුණාරත්න සහ පුත්‍රයෝ, කොළඹ 10.

3 ගල්මංගොඩ සුමනපාල, (2012) *ආදි බෞද්ධ දර්ශනය,* සරස්වතී ප්‍රකාශන, දිවුලපිටිය.

4 ජයවික්‍රම, එන්. ඒ. (1967), *ථෙරීගාථා,* එම්. ඩී. ගුණසේන, කොළඹ.

5 ඤාණිස්සර හිමි, ඇල්පිටියේ, (1988) *භාරත දර්ශන,* එස්. ගොඩගේ සහ සහෝදරයෝ කොළඹ.

6 ධර්මදාස, කේ. එන්.ඕ. (1996), *භාෂාව හා සමාජය,* එස්. ගොඩගේ සහෝදරයෝ, කොළඹ.

7 පඤ්ඤාසාර හිමි, දෙහිගස්පේ (1958), *මහාවග්ග පාලි,* කොළඹ.

8 විමලවංශ ස්ථවිර, (1950), *දර්ශනවාද සංග්‍රහය,* අනුලා මුද්‍රණාලය, කොළඹ.

9 සරණංකර හිමි, ගලිගම පණ්ඩිත. (1970), *සිතුවම් සහිත සම්මාදාස නම් වූ සිංහල මිලින්ද ප්‍රශ්නය,*

10 සුමනසාර හිමි, කරගම්පිටියේ. (1953), *න්‍යායබින්දුව,* එස්. ගොඩගේ සහෝදරයෝ, කොළඹ.

11 සෝමානන්ද හිමි, තෙරිපැහැ. (1976), *විචාරභාෂා,* පානදුර.

12 සෝමාලෝකතිස්ස හිමි, වලගෙදර. (1966), *උදාන පාලි,* නුගේගොඩ.

13 ශාසනරතන හිමි, මොරටුවේ. (1970), *මූලමාධ්‍යමික කාරිකාව,* අනුලා මුද්‍රණාලය, කොළඹ.

14 *දීඝනිකාය,* බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, 1960.

15 *මජ්ඣිම නිකාය,* (1960). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

16 *සංයුක්ත නිකාය,* (1960). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවග

17 *සුත්ත නිපාතය,* (1960). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

18 *අංගුත්තර නිකාය,* (1960). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

19. හේවාවිතාරණ මුද්‍රණය, (1917), *පපඤ්චසූදනී,* කොළඹ.

20. *Encyclopedia of Buddhism*, vol, 4 & 6, 1976.

21. Keith A.B (1993), *Buddhist Philosophy*, New Delhi.

22. Khemananda, H. (1993). *Logic and Epistemology in Theravāda* (Theravāda Nyāya). Colombo: Karunaratna and Sons Ltd.

23. Mookerjee. S. (1993), *The Buddhist Philosophy of Universal flug*, New Delhi.

24. Sumanapala. G. D. (1998), *Theravada Adhidhamma,* Singapore.

25. *Universal Dictionary*, London: 1988

26. (P.T.S) Pali Text Society. Dictionary, London: 1967.